නල්ලූර් ප්‍රාදේශිය සභාව
යාපනය දිස්ත්‍රික්කය.
--------------------------------

1. මූල්‍ය ප්‍රකාශ
---------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌනතා
------------------------

(i.) මූල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ඌනතා ආදායම් , වත්කම් හා බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මූල්‍ය ඌනතා කෙරෙහි බලපෑම | ආදායම් | | වත්කම් | | බැරකම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| වැඩියෙන් දැක්වීම | 01 | 11,795 | 02 | 27,216,973 | 02 | 25,754,931 |
| අඩුවෙන් දැක්වීම | - | - | 02 | 132,098 | - | - |

(ii.) 2009 වර්ෂය තුලදි ත්‍යාගයක් වශයෙන් පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාගත් වාහන දෙකක වටිනාකම තක්සේරු කර නොතිබුණි. ඒ හේතු කොට ගෙන මෝටර් රථ වටිනාකම ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

----------------------------------------

අවශ්‍ය සාක්ෂි නොමැතිකම නිසා රු.57,672,920 ක් සඳහා වූ ගනුදෙනු විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

-------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත. | | |
| පරිච්ඡේදය V - වගන්තිය 132 | - | විනෝද කටයුතු සඳහා රු.1000 ඉක්මවන වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ. එනමුත් සමාලෝචිත වර්ෂය තුලදි අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව විනෝද කටයුතු සඳහා රු.5,964 ක් වැයකර තිබුණි. |
| පරිච්ඡේදය V - වගන්තිය 158(1) | - | රු.5,936,350 ක් වූ තක්සේරු බදු අයකර ගැනිම සඳහා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |
| පරිච්ඡේදය V - වගන්තිය 140 | - | බේරුම් නොකළ රු.8,222,926 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |
| පරිච්ඡේදය XIV - වගන්තිය 140 | - | රෙගුලාසියට පටහැනිව, සභාපති විසින් සභා අරමුදලෙන් රු.24,796 ක් වැය කර දින 5 ක් සඳහා වාහනය කුලියට ගෙන තිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

--------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.218,207 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.7,990,541 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

අයවැය විධිමත්ව සකස් කර නොතිබු බැවින් අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර රු.31,411,023 ක වෙනසක් ද, අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.15,260,379 ක වෙනසක් ද විගණනයේදී නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

---------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

----------------------------------------------------------

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තගත ආදායම තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට හිඟ සමුච්චිත ආදායම |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 2,789 | 2,662 | 5,937 |
| (ii) බදු කුලි | 26,625 | 28,149 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,580 | 3,648 | 3 |
| (iv) වෙනත් ආදායම් | 97,506 | 63,629 | 118,237 |

2.3.2 ආදායම් එකතු කිරිම

-----------------------

රු.7,812,231 ක් වු හිඟ ආදායම් අයකර ගැනිම සඳහා සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුලදි ඵලදායි සහ නෛතික ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ මුදල්

------------------

සමාලෝචිත වර්ෂය අවසානයේදි රු.3,000 ක් වු උසාවියෙන් ලැබිය යුතු හිඟ දඩමුදල් ආදායම් සහ ලැබිය යුතු මුදල් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම මුදල් ලැබී නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

---------------

2006, 2010, 2011, 2012 සහ 2013 වර්ෂ සඳහා මුද්දර ගාස්තු වශයෙන් ගිණුම් ගතකළ රු.122,385,282 ක මුදල ලබා ගැනිම සඳහා ඵලදායි ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

----------------------------

2.4.1 අක්‍රිය භෞතික වත්කම්

-----------------------

2011 වර්ෂය තුල රු.5,354,000 කට මිලට ගත් කුරුන්දන්පුලම් ඉඩම වසර දෙකක් තිස්සේ නිෂ්ක්‍රීයව පැවතිණි.

2.4.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

--------------------------------

තොග අයිතම 13 ක අතිරික්තයක් වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙන් හෙළි වී තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

2.5.1 අත්හරින ලද ව්‍යාපෘති

------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය තුලින් වෙන්කර තිබු රු.928,080 ක් සඳහා වූ ව්‍යාපෘති තුනක් නිම කිරිමෙන් තොරව අත්හැර දමා තිබුණි.

2.5.2 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

---------------------------------

සමාලෝචිත වර්ෂය තුලදි සභා අරමුදලින් රු.24,187,831 ක් වටිනාකමැති ව්‍යාපෘති 23 ක් ක්‍රියාත්මක කිරිමට යෝජිතව පැවති නමුත්, ඒවා ක්‍රියාත්මක කිරිමෙන් තොරව විවිධ ණයගැති ගිණුමට ඇතුලත් කර තිබුණි.

2.6 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

සමාලෝචිත වර්ෂයේ වියදම් දැරීම සඳහා රුපියල් මිලියන 22.2 ක් වූ ස්ථාවර තැන්පතු ආපසු ගෙන තිබුණි. තවදුරටත් ජංගම බැංකු ගිණුමේ රු.මිලියන 8.9 ක් පැවති අතර විවිධ ණයගැති ප්‍රමාණය රු.මිලියන 25.7 ක් විය. මේ අනුව ස්ථාවර තැන්පතු තවදුරටත් ආපසු ලබා ගැනිමට සිදුවිය හැකි අතර එය කළමනාකාරිත්වයේ අකාර්යක්ෂමතාව පෙන්නුම් කිරිමක් ලෙස පෙනි යයි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් එකතු කිරිම

(ආ) අයවැය

(ඇ) අත්තිකාරම්

(ඈ) විවිධ ණයගැතියෝ

(ඉ) වාහන

(ඊ) විවිධ තැන්පතු